# රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# ප්‍රගති වාර්තාව

## அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை

# Public Service Commission
# Progress Report

# 2016.01.01 – 2016.09.30

# පටුන


| අනු අංකය | කාරණය | පිටු අංකය |
|---|---|---|
| 01 | හැඳින්වීම | 01 |
| 02 | කොමිෂන් සභා රැස්වීම් | 01 |
| 03 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග | 02 |
| | • සේවා ලාභී ප්‍රඥප්තියක් සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම | 02 |
| | • ඉලක්ක දින මුද්‍රාව ක්‍රියාත්මක කිරීම | 02 |
| | • කාර්යාල කටයුතු පසු විපරම් කිරීම | 02 |
| | • අතිරේක ලේකම්වරුන්ගේ වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම | 03 |
| | • අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් තොරතුරු රැස් කිරීමේ ආකෘති පත්‍ර | 03 |
| 04 | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු රැස්වීම් | 03 |
| 05 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංශ ක්‍රියාකාරකම් | 04 |
| | • ආයතන අංශය | 04 |
| | • පත් කිරීම් අංශය | 07 |
| | • උසස් කිරීම් අංශය | 09 |
| | • විනය අංශය | 10 |
| | • අභියාචනා අංශය | 12 |
| 06 | රජයට එරෙහිව අධිකරණයේ පැවති නඩු ඉවත් කර ගැනිම | 14 |

## 01.හැදින්වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ නව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2015.10.15 දින සිට සිය රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව සෑම වසරකම පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ උපදෙස් මත සෑම කාර්තුවකට වරක් ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිතය. එසේ සෑම කාර්තුවකටම වරක් ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට 2016 සැප්තැම්බර් මසදී දන්වන ලද බැවින් 2016.01.01 දින සිට 2016.09.30 දක්වා කාර්තු තුනෙහි ප්‍රගතිය එකවර ඉදිරිපත් කර ඇත.

පාර්ලිමේන්තුවට කාර්තු වශයෙන් වාර්තා ඉදිරිපත් කල යුතු වුවද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එහි ප්‍රගතිය මාසිකව ලබා ගෙන එම වාර්තා අධීක්ෂණය කරනු ලබයි. පසුගිය කාර්තු තුන ඇතුළත විශේෂ අවහිරතාවයකින් තොරව කොමිෂන් සභාවේ කටයුතු සිදුකර ඇත.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභා රැස්වීම්

2015.10.15 දින සිට 2016.09.30 දින දක්වා පවත්වන ලද රැස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2015 වර්ෂය (2015.10.15 –2015.12.31)

| මාසය | රැස්වීම් ගණන |
|---|---|
| ඔක්තෝබර් | 04 |
| නොවැම්බර් | 10 |
| දෙසැම්බර් | 11 |
| එකතුව | 25 |

2016 වර්ෂය (2016.01.01 – 2016.09.30)

| මාසය | රැස්වීම් ගණන |
|---|---|
| ජනවාරි | 10 |
| පෙබරවාරි | 10 |
| මාර්තු | 10 |
| අප්‍රේල් | 08 |
| මැයි | 10 |
| ජූනි | 10 |
| ජූලි | 08 |
| අගෝස්තු | 08 |
| සැප්තැම්බර් | 09 |
| එකතුව | 83 |

## 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සේවා දායකයාට ලබාදෙන සේවය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී ව ඉටුකිරීම සඳහා මෙකී කාල පරිච්ඡේදය තුල පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

i. <u>සේවාලාභී ප්‍රඥප්තියක් සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම.</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉටුකරනු ලබන සේවාවන් **පත්කිරීම් අංශය, උසස් කිරීම් අංශය,විනය අංශය,අභියාචන අංශය,ආයතන අංශය,පාලන අංශය හා ගිණුම් අංශය** වශයෙන් අංශ හතක් මගින් ඉටු කරනු ලබයි.මෙම අංශ මගින් ඉටු කරනු ලබන එක් එක් කාර්යයන් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව එම එක් එක් කාර්යන් කාර්යක්ෂමව හා සඵලදායක ලෙස මහජනතාව වෙත ලබා දීම අරමුණු කොට ගෙන සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වා දී ඇත.

මෙහිදී පහත සඳහන් වර්ගීකරණයන් යටතේ ප්‍රඥප්තිය සකස් කර ඇත.

1.ලබා දෙන සේවයේ ස්වභාවය
2.ඒ සඳහා අවශ්‍ය තොරතුරු
3.අදාළවන නීති සංග්‍රහ,රෙගුලාසි ආදිය
4.වැඩ පියවර
5.ගතවන කාලය
6.අදාළ නිලධාරීන්

මෙම සේවා ලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමත් සමඟ කොමිෂන් සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කර ගැනීමට හැකි වී ඇත. තවද, සේවා ලාභී ප්‍රඥප්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම නියාමනය කිරීම සඳහා එහි කාලවකවානු හා සම්මතයන් ඇතුළත් කර සුවිශේෂී වූ ඉලක්ක දින මුද්‍රාවක් හඳුන්වා දී ඇත.

ii. <u>ඉලක්ක දින මුද්‍රාව (Target Seal) ක්‍රියාත්මක කිරීම</u>

මෙමගින් එක් එක් කාර්ය ඉටු කිරීම සඳහා ගතවන සම්පූර්ණ කාලය හා අදාළ කාර්යය ඉටු කිරීමේදී ඊට මැදිහත්වන නිලධාරීන් ඒ සඳහා ගතකරන කාලය දක්වනු ලබයි.එමගින් යම් කිසි කාර්යයක් ඉටුකිරීමේ දී ප්‍රමාදයක් ඇතිවන්නේ නම් ඒ පිලිබඳ වගකීම අදාළ නිලධාරියා හට පැවරේ.මෙමගින් එක් එක් කාර්යන් ඉටු කිරීමේ දී නිලධාරීන් අතින් සිදුවන ප්‍රමාදයන් අවම කිරීම මගින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමද අපේක්ෂා කෙරේ.

iii. <u>කාර්යාල කටයුතු පසු විපරම් කිරීම</u>

මෙම කොමිෂන් සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටුකරලීම සඳහා සතියකට වරක් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි රැස්වීම්ද, අවස්ථානෝචිත පරිදි සියළු මාණ්ඩලික නිලධාරි රැස්වීම් හා කාර්ය මණ්ඩල රැස්වීම්ද සෑම කාර්තුවකට වරක් විගනණ කළමනාකරණ රැස්වීම්ද පවත්වන ලදී. සෑම අංශයකින්ම මාසිකව ප්‍රගති වාර්තා ලබා ගෙන එම අංශයන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීමේ පසු විපරම් ක්‍රමයක් මාසිකව ක්‍රියාත්මක කිරීමෙන් මෙම කොමිෂන් සභාවේ මෙහෙවර වඩාත් ඵලදායීව ඉටු කිරීම සඳහා කටයුතු කර ඇත.

iv. <u>අතිරේක ලේකම්වරුන්ගේ වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ඒ හා සම්බන්ධ ආයතන අතර පවතින සහයෝගීතාව හා සුහදතාව වර්ධනය කරගැනීමත් රාජකාරී ඉටු කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ඒ ඒ ආයතන හඳුනාගත් ගැටලු නිරාකරණය කර ගැනීමත් තුලින් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් වාර්ෂිකව සියලු අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් වාර්ෂික සමාලෝචන රැස්වීම පවත්වනු ලැබේ. මෙම වර්ෂයට අදාළ රැස්වීම 22.07.2016 දින පැවැත්විණි.

v. <u>අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවලින් තොරතුරු ගෙන්වා ගැනීම සඳහා සකස් කරන ලද ආකෘති පත්‍ර</u>

2009.02.20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතුව ඇති කාර්යන්ට අදාළව උපදෙස්,තීරණ හා නියෝග ඉල්ලා සිටීමේදී, එම කාර්යයන් වඩාත් කාර්යක්ෂම හා විධිමත් කිරීමත් ප්‍රමාදයන් වැළැක්වීමත් අරමුණු කොටගෙන අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවලින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී අකෘති පත්‍ර හඳුන්වා දී ඇති අතර දැනට පවතින මෙම ආකෘතී පත්‍රවල ඇති අඩු පාඩුද සංශෝධනය කර නව ආකෘති පත්‍ර ද හඳුන්වා දී ඇත.

## 04. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු රැස්වීම්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුළ පැන නැගී ඇති ගැටළු නිරාකරණය කිරීමේදී කාර්යක්ෂම ලෙස වඩාත් සාර්ථක විසඳුම් සෙවීම සඳහා අදාල අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සමඟ පහත සඳහන් පරිදි සාකච්ඡා පවත්වන ලදී.

| අනු අංකය | දිනය | කාරණය | සහභාගී වූ දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ/ආයතන |
|---|---|---|---|
| 01 | 2016.03.02 | ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ තනතුරු පුරප්පාඩු පිරවීම | කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය/බුද්ධිමය දේපල කාර්යාලය |
| 02 | 2016.05.05 | වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත අඩවි ආරක්ෂක නිලධාරීන් යෙදවීම පිළිබඳ සාකච්ඡා කිරීම | තිරසාර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශය/ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 03 | 2016.06.29 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී හා ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්ගේ ගැටළු සම්බන්ධව සාකච්ඡා කිරීම | අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 04 | 2016.08.26 | තැපැල් දෙපාර්තමේන්තුවේ ගැටළු පිළිබද සාකච්ඡාව | තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය / තැපැල් දෙපාර්තමේන්තුව |

| 2016.09.30 දිනෙන් පසු පවත්වන ලද රැස්වීම් | | | |
|---|---|---|---|
| 05 | 2016.10.06 | දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළව පැන නැගී ඇති ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා පොදු ක්‍රම වේදයක් සකස් කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය/ මුදල් අමාත්‍යාංශය |
| 06 | 2016.10.10 | දීප ව්‍යාප්ත සේවා පිළිබඳ පැන නැගී ඇති ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීම | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව/රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය/මුදල් අමාත්‍යාංශය |
| 07 | 2016.10.11 | දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාවේ ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | මුදල් අමාත්‍යාංශය/ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 08 | 2016.11.01 | ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනාඥවරුන් හා ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනාඥවරුන් ගේ උසස් වීම් සම්බන්ධ ගැටළුව | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය/ ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව |
| 09 | 2016.11.01 | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනාඥ හා සංඛ්‍යාලේඛනඥ ජ්‍යෙෂ්ඨතාවය පිළිබඳ ඇතිවී ඇති ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය/ ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව |
| 10 | 2016.11.02 | වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු පිරවීම පිළිබඳ සාකච්ඡා කිරීම | තිරසාර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශය/ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 11 | 2016.11.02 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් නිලධාරින්ගේ උසස් වීම් සම්බන්ධව | කෘෂිකර්ම අමාත්‍යාංශය/ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 12 | 2016.11.02 | ශ්‍රී ලංකා විදේශ සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීම පිළිබඳ සාකච්ඡාව | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 13 | 2016.11.10 | අධ්‍යාපන සේවා කමිටුව පිහිටවූ පසු ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීම හා වර්තමාන ප්‍රගතිය විමසීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 14 | 2016.11.18 | වෛද්‍ය සේවයේ ගැටළු සාකච්ඡා කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවා අංශයේ නිලධාරින් |

## 05. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංශ ක්‍රියාකාරකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් අංශ මගින් සමන්විත වන අතර, ඒවායින් ඉටු කරනු ලබන කාර්යයන් පහතින් දක්වා ඇත.

### i. ආයතන අංශය

අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදුකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක්ද, එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නාවූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීම ආයතන අංශය මගින් සිදුකරයි. එම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමේදී, අනුමත සෑම තනතුරකටම නිලධරයන් බඳවා ගැනීමේ දී අනුගමනය කළ යුතු බඳවා ගැනීමේ ක්‍රමය, බඳවාගැනීමේ සුදුසුකම්, තනතුරට අදාළ වැටුප් පරිමාණය, සේවා කොන්දේසි, උසස් කිරීමේ ක්‍රමවේද සහ අදාළ අනෙකුත්

සියලු විස්තර ඇතුලත් කිරීම සිදුකරයි. අදාළ සේවා ව්‍යවස්ථාව හෝ බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීමට ප්‍රථම තනතුරු අනුමත කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ද, වැටුප් පරිමාණය සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද, සේවා ව්‍යවස්ථාව හෝ බඳවාගැනීමේ පටිපාටි කෙටුම්පත සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශයද ලබාගනී.

**ආයතන අංශය මගින් ඉටු කරනු ලබන කාර්යයන්.**

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලතල පැවරීමට අදාළ කටයුතු.

(ii) රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීමේ කටයුතු

(iii) සියලුම සේවාවන් සඳහා ස්ථානමාරු පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීම.

(iv) අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක්, බඳවාගැනීමේ පටිපාටියක් හෝ ස්ථානමාරු පටිපාටියක් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් අදාළ ලේකම්වරයාගේ නිර්දේශ මත එම ව්‍යවස්ථාව හෝ පටිපාටිය සංශෝධනය කිරීමට කටයුතු කිරීම.

(v) බලය අභිනියෝජිත බලධරයන් විසින් කරනු ලබන පත්කිරීම්, උසස්කිරීම් වලට අදාලව පැන නගින ගැටළුවලට විසඳුම් ලබාගැනීම සඳහා එවනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබාදීමට කටයුතු කිරීම.

(vi) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි, ස්ථානමාරු පටිපාටි, චක්‍රලේඛ සහ නියෝගවලින් බැහැරව කටයුතු කිරීමට සිදුවන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටළුවලට විසඳුම් ලබාදීමට කටයුතු කිරීම.

**2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර.**

| | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නව බඳවාගැනීමේ පටිපාටි සැකසීම සහ අනුමත කිරීම | 64 |
| 2 | නව සේවා ව්‍යවස්ථා සැකසීම සහ අනුමත කිරීම | 1 |
| 3 | බඳවාගැනීමේ පටිපාටි සංශෝධන | 41 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධන | 30 |
| 5 | ස්ථානමාරු පටිපාටි සැකසීම සහ අනුමත කිරීම | 10 |

| | | |
|---|---|---|
| 6 | ස්ථානමාරු පටිපාටි සංශෝධන | 7 |
| 7 | බඳවා ගැනීමේ පටිපාටි සහ සේවා ව්‍යවස්ථාවල නිවැරදි කිරීම් | 8 |
| 8 | රා.සේ.කො.ස. චක්‍රලේඛ නිකුත් කිරීම | 4 |
| 9 | විශේෂ අවස්ථාවන්හිදි බඳවාගැනීමේ පටිපාටිවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබාගැනීම | 16 |
| 10 | විශේෂ අවස්ථාවන්හිදි සේවා ව්‍යවස්ථාවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබාගැනීම | 10 |
| 11 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට අදාල කරුණු සම්බන්ධයෙන් පැන නගින ගැටළු වලට විසඳුම් ලබාදීම | 1 |
| 12 | ප්‍රතිපත්තිමය ගැටළුවලට විසඳුම් ලබාදීම | 100 |
| 13 | පොදු කරුණු සම්බන්ධ ගැටළු වලට විසඳුම් ලබාදීම | 77 |
| 14 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරිය, අභියාචනාධිකරණය සම්බන්ධ නඩු | 54 |
| | **එකතුව** | **423** |

**සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කටයුතු කළ නඩු පිළිබඳ විස්තර**

පරිපාලන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව තිබූ පැමිණිලි

| 2015.12.31 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2016.09.30 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ සනාථ කළ සංඛ්‍යාව | රා.සේ.කො. තීරණ අවලංගු කළ සංඛ්‍යාව | 2016.09.30 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 16 | 10 | 26 | 2 | 1 | 23 |

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු

| 2015.12.31 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2016.09.30 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කළ නඩු සංඛ්‍යාව හා රා.සේ.කො. තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණයවිසින් රා.සේ.කො. තීරණ අවලංගු කළ සංඛ්‍යාව | 2016.09.30 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 60 | 12 | 72 | 6 | 0 | 66 |

අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ නඩු

| 2015.12.31 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2016 වසර තුළ ලැබුණු සංඛ්‍යාව | 2016.09.30 දිනට ලැබී තිබූ මුළු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණය සනාථ කළ සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රා.සේ.කො. තීරණ අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2016.09.30 දිනට නිම නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 5 | 5 | 10 | 0 | 0 | 10 |

❖ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත,මානව හිමිකම් කොමිෂන් සභාව වෙත හා මහජන පෙත්සම් කාරක සභාව වෙත සමාලෝචිත කාල පරිච්ඡේදය තුල ඉල්ලීම් ඉදිරිපත් වී නොතිබිණි.

## ii. පත්කිරීම් අංශය

අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම් වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පලාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් පත් කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනීම් පටිපාටි/ උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම , සේවයේ ස්ථිර කිරීම , සේවය අවසන් කිරීම , කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩ බැලීමේ / රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීම , මුදාහැරීම (ස්ථිර / තාවකාලික) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම , සේවයෙන් ඉල්ලා අස්වීම , සේවයට / තනතුරට නැවත පත්කිරීම , විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත, අනිවාර්ය, වෛද්‍ය හේතූන් මත), විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම . සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී ) පත්කිරීම.

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග / තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබේ.

| | පත්කිරීම් අංශයේ ප්‍රගතිසමාලෝචනය<br>**(2016.01.01 – 2016.09.30)** | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් | 619 |
| 2 | ස්ථිර කිරීම් | 1406 |
| 3 | බඳවා ගැනීම් | 1625 |
| 4 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | 570 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම් | 19 |
| 6 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 933 |
| 7 | වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට පත් කිරීම් | 747 |
| 8 | මුදාහැරීම් | 107 |
| 9 | ඉල්ලා අස්වීම් | 13 |
| 10 | අන්තර්ග්‍රහණය කිරීම් | 72 |
| | | **6111** |

2015.12.31 දිනට අංශයට පෙනී සිටීමට ඉතිරිව තිබූ නඩු හා පැමිණිලි පිළිබඳ විස්තර හා එම ප්‍රමාණයෙන් 2016.09.30 දිනට අවසන්ව තිබූ නඩු හා පැමිණිලි ප්‍රමාණය

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු

| | **2015.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව** | **2016 වර්ෂයේ දී අවසන් වූ සංඛ්‍යාව** |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර ගොනු කළ | 28 | 05 |
| 2016 වර්ෂයේ ගොනු කළ | 06 | 02 |

අභියාචනාධිකරණ නඩු

| | **2015.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව** | **2016 වර්ෂයේ දී අවසන් වූ සංඛ්‍යාව** |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර ගොනු කළ | 10 | 00 |
| 2016 වර්ෂයේ ගොනු කළ | 02 | 00 |

පරිපාලන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි

| | **2015.12.31** **දිනට ඉතිරි සංඛ්‍යාව** | **2016 වර්ෂයේ දී අවසන් වූ සංඛ්‍යාව** |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර ගොනු කළ | 83 | 28 |
| 2016 වර්ෂයේ ගොනු කළ | 25 | 01 |

ඉහත සඳහන් නඩු හා අභියාචනාවලට අමතරව 2016 01.01.දින සිට 2016.09.30 දින දක්වා කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 18 ක් හා මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 06 ක් සම්බන්ධව ක්‍රියා කර තිබේ.

**iii. උසස්කිරීම් අංශය**

අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් ( අමාත්‍යාංශ ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර ) සම්බන්ධයෙන් වන උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් උසස් කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනිම් පටිපාටි/ උසස්කිරීම් පටිපාටි අනුව උසස්කිරීම (ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත) , තනතුරුවලට පත්කිරීම (ජ්‍යෙෂ්ඨතාවය මත / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව)

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග / තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබේ.

| | **උසස්කිරීම් අංශයේ ප්‍රගතිසමාලෝචනය (2016.01.01 – 2016.09.30)** | |
|---|---|---|
| 1 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 3404 |
| 2 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 412 |
| 3 | තනතුරුවලට පත් කිරීම් | 335 |
| | **එකතුව** | **4151** |

2015.12.31 දිනට අංශයට පෙනී සිටීමට ඉතිරිව තිබූ නඩු හා පැමිණිලි පිළිබඳ විස්තර හා එම ප්‍රමාණයෙන් 2016.09.30 දිනට අවසන්ව තිබූ නඩු හා පැමිණිලි ප්‍රමාණය

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු

| | 2015.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව | 2016 වර්ෂයේ දී අවසන් වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර ගොනු කළ | 26 | 03 |
| 2016 වර්ෂයේ ගොනු කළ | 10 | 00 |

අභියාචනාධිකරණ නඩු

| | 2015.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව | 2016 වර්ෂයේ දී අවසන් වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර ගොනු කළ | 03 | 00 |
| 2016 වර්ෂයේ ගොනු කළ | 01 | 00 |

පරිපාලන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි

| | 2015.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව | 2016 වර්ෂයේ දී අවසන් වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2016 වර්ෂයට පෙර ගොනු කළ | 81 | 08 |
| 2016 වර්ෂයේ ගොනු කළ | 05 | 01 |

ඉහත සඳහන් නඩු හා අභියාචනාවලට අමතරව 2016 01.01.දින සිට 2016.09.30 දින දක්වා කාලය තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 06 ක් හා මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිලි 04 ක් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ දන්වා යවා ඇත.

**iv. විනය අංශය**

දීප ව්‍යාප්ත සේවාවන්වලට අයත් මාණ්ඩලික නිලධරයන් හා රාජ්‍ය පරිපාලන පරිපාලන චක්‍රලේඛ අංක 6/2006හි MN-7 හා ඊට ඉහළ වැටුප් පරිමාණය හිමි නිලධාරීන් සම්බන්ධ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ පළමු වන උප ලේඛනයෙහි සඳහන් වැරදිවලට අදාළ විනය පාලන බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ඉහත කී බලතල ප්‍රකාරව ඒ ඒ අවස්ථාවන්හිදී අවශ්‍ය නියෝග ලබා දීම සඳහා විනය අංශය කොමිෂන් සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

**විනය අංශයෙහි කාර්යභාරය**

දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් සිදු කරනු ලබන මූලික විමර්ශනවලට අදාළව දීප ව්‍යාප්ත සේවාවන්වලට අයත් නිලධාරීන්ද ඇතුළුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1733/52 හා 2011.11.25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරින්ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

**2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා විනය අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර**

| අනු අංකය | කාරණය | නියෝග ගණන - 2016.01.01 සිට 2016.09.30 දක්වා |
|---|---|---|
| 1 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 77 |
| 2 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 18 |
| 3 | චෝදනාවලින් නිදහස් කිරීම | 50 |
| 4 | සේවයෙන් පහ කිරීම | 03 |
| 5 | අනෙකුත් විනය දඬුවම් | 56 |
| 6 | නැවත සේවයේ පිහිටුවීම | 26 |
| 7 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 13 |
| 8 | වි.වැ.ව්‍ය.සං.12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 12 |
| 9 | අනිවාර්ය නිවාඩු ගැන්වීම | 4 |
| 10 | අනිවාර්ය විශ්‍රාම ගැන්වීම් | 1 |
| 11 | වැඩ තහනම් කිරීම | 8 |
| 12 | විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම | 93 |
| 13 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 11 |
| 14 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | 3 |
| 15 | විනය කටයුතු අවසන් කිරීම් | 47 |
| 16 | අනිකුත් සාමාන්‍ය නියෝග | 286 |
| 17 | AAT අභියාචනා සඳහා නිරීක්ෂණ | 34 |
| 18 | අධිකරණ අයදුම්පත් සඳහා නිරීක්ෂණ | 07 |
| | **එකතුව** | **749** |

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල කටයුතු කළ නඩු පිළිබඳ විස්තර

| | ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් සංඛ්‍යාව | අභියාචනාධිකරණ අයදුම්පත් සංඛ්‍යාව | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|---|
| 2015.12.31 දින වන විට ගොනු කර තිබූ ප්‍රමාණය | 31 | 20 | 122 |
| 2015.12.31 දිනට ඉතිරිව තිබූ ප්‍රමානයෙන් 2016.09.30 දිනට අවසන්ව තිබූ ප්‍රමාණය | 26 | 14 | 23 |
| 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා අලුතින් ගොනු කරන ලද ප්‍රමාණය | 05 | 03 | 17 |
| 2016.09.30 දිනට ඉතිරිව ඇති ප්‍රමාණය | 10 | 09 | 116 |

**v. අභියාචනා අංශය**

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, රජයේ නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු, ඔවුන් විෂයෙහි විනය පාලනය සහ සේවයෙන් පහ කිරීමේ බලතල පහත සඳහන් කර ඇති රජයේ (අති විශේෂ) ගැසට් නිවේදනවල සඳහන් කර ඇති ආකාරයට අභිනියෝජනය කරනු ලැබ ඇත.

    i. 2011.11.25 දිනැතිව අංක 1733/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රය.

    ii. 2016.02.25 දිනැති අංක 1955/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2015.11.20 දිනැති අංක 1941/41 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය

2. එම බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

3. ඉහත ආකාරයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධව පහත කටයුතු අභියාචනා අංශය විසින් සිදු කරනු ලබයි.

    i. එක් එක් අභියාචනය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුලත් වාර්තා කැඳවීම.

    ii. ඉන්පසුව එක් එක් අභියාචනය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

    iii. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණ අභියාචක වෙත හා අනිකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම.

    iv. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණවලට එරෙහිව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන

අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ එම අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම.

v. මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාගයට ගනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම.

vi. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ ඉදිරිපත් කිරීම.

2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා අභියාචනා අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර

| අනු අංකය | කාරණය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පෙර වර්ෂ වලින් 2016 වර්ෂය සඳහා ඉදිරියට ගෙන ආ අභියාචනා ප්‍රමාණය | | 821 |
| 2 | 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා ලැබුනු අභියාචනා ප්‍රමාණය | | 685 |
| | **එකතුව** | | **1506** |
| 3 | ඉහත අභියාචනා ප්‍රමාණයෙන් 2016.09.30 දින වන විට කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය | | 868 |
| | කටයුතු නිම කළ අභියාචනා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ. | | |
| | විනය කරුණු සම්බන්ධ අභියාචනා | 210 | |
| | උසස් වීම් සම්බන්ධ අභියාචනා | 82 | |
| | තනතුර අතහැර යාමේ නිවේදනය පිළිබඳ අභියාචනා | 237 | |
| | ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා | 95 | |
| | පත්කිරීම් සම්බන්ධ අභියාචනා | 19 | |
| | වැඩ තහනම් කිරීම සම්බන්ධ අභියාචනා | 19 | |
| | වෙනත් | 206 | |
| | **එකතුව** | **868** | |
| 4 | 2016.09.30 දින වන විට කටයුතු කිරීමට ඉතිරිව තිබූ අභියාචනා ප්‍රමාණය | | **638** |
| | කටයුතු කිරීමට තිබූ අභියාචනා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ. | | |
| | බලය අභිනියෝජිත බලධරයන් විසින් නිරීක්ෂණ නිර්දේශ වාර්තා ලැබී ඇති අභියාචනා ප්‍රමාණය | 182 | |
| | නිරීක්ෂණ වාර්තා ලැබී නොමැති අභියාචනා ප්‍රමාණය | 456 | |
| | **එකතුව** | **638** | |
| 5 | පෙර වර්ෂයන්ද ඇතුළත්ව 2016.09.30 දිනට පවතින අධිකරණ නඩු ගණන | | 30 |
| 6 | පෙර වර්ෂයන්ද ඇතුළත්ව 2016.09.30 දිනට පවතින පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරී නඩු ගණන | | 191 |
| 7 | 2016.01.01 දින සිට 2016.09.30 දක්වා මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් ගණන | | 7 |

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල කටයුතු කළ නඩු පිළිබඳ විස්තර

| විස්තරය | **2015.12.31** දිනට පැවති සංඛ්‍යාව | **2015.12.31** දින සිට **2016.09.30** දින දක්වා අළුතින් ලද ප්‍රමාණය | **2015.12.31** දින සිට **2016.09.30** දින දක්වා ක්‍රියාකර අවසන් සංඛ්‍යාව | **2016.09.30** දිනට පවතින ප්‍රමාණය |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු සංඛ්‍යාව | 24 | 8 | 5 | 27 |
| අභියාචනාධිකරණ නඩු සංඛ්‍යාව | 02 | 01 | 00 | 03 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ විභාග වන අභියාචනා සංඛ්‍යාව | 187 | 49 | 45 | 191 |
| එකතුව | 213 | 58 | 50 | 221 |

2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා පෙනී සිටි මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් සංඛ්‍යාව } 49

2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා පෙනී සිටි මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් සංඛ්‍යාව } 07

## 06. රජයට එරෙහිව අධිකරණයේ පැවති නඩු ඉවත් කර ගැනීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගන්නා ලද නම්‍යශීලී තීරණ හේතුවෙන් රජයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ නඩු 06 ක් ඉවත් කර ගැනීමට හැකිවී තිබේ.

-------------------------------//----------------------------